යාපනය සරසවියේ සිසුවකු දිවි තොර කර ගැනීමකින් මිය ගිය පුවත සිංහල භාෂා පුවත්පත් කිහිපයක සහ දමිළ භාෂා පුවත්පතක පළ වී තිබුණේ මේ ආකාරයෙනි.
* දිනමිණ, ලංකාදීප - දිවි තොර කර ගත් ආකාරය සඳහන් කර ඇත.
* දිවයින, දිනමිණ හා තමිලන් - මියගිය අයගේ ඡායාරූපයක් පළකර ඇත.
* දිවයින, දිනමිණ, ලංකාදීප හා තමිලන් - හදිසි උපකාරක අංක සඳහන් කර නැත.
මෙවැනි සිදුවීමකදී, දිවි තොර කර ගත් ආකාරය සඳහන් නොකිරීම ඔස්සේ, අනුකාරක දිවි තොරකර ගැනීම් ඇති විය හැකි ඉඩ අවම කරගත හැක.
එසේම, දිවි තොර කර ගැනීම් පිළිබඳව වන පුවත් වාතර්ාවන් සමඟින්, හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇතිව සිටින අයෙකුට අවශ්‍ය උපදේශනය ලබා දීමටත්, ඒ ඔස්සේ එම තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීමටත් ඉඩක් ලැබිය හැක.
*දිවි තොරකර ගත් අයගේ අනන්‍යතාවයන් (මහජන බැඳියාවට අයත් නම් මිස) හෙළි නොකිරීම, මිය ගිය අයගේ පවුලේ අය සහ සමීපතමයන්ට මුහුණ දීමට සිදුවිය හැකි, වේදනාව සහ දිවි තොර කර ගැනීම් සම්බන්ධ සමාජ ගහර්ාව අවම කරනු ඇත.
ඒ අනුව, මෙම පුවත්පත් වලට, දිවි තොරකර ගැනීමේ සිදුවීමක් වාතර්ා කිරීමේදී මෙයට වඩා වගකීම් සහගත විය හැකිව තිබුණා යැයි ඔබ නොසිතන්නේ ද?
උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්යෙන් සම්බන්ධ කරගත හැක).
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!